# අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා සිසුන් උපකාරක පංති වලට යොමු වීමේ ප්‍රවණතාවය විමසීම.

**ආර්. එම්. ටී. පී. ජයසේකර**[1]

**සංක්ෂේපය**

වර්තමාන ශ්‍රී ලංකාවේ සිසුන්ගේ ඉගෙනුම් ක්‍රම අතර පෞද්ගලික උපකාරක පංති වලට වැදගත් තැනක් හිමි වේ. පෞද්ගලික උපකාරක පංතියකින් අමතර ඉගැන්වීමක් නොලබා විභාගය සමත් විය නොහැකි යන මතය සමාජය පුරා පැතිර පවති. මේ නිසා දිවයින පුරා විවිධ මාදිලියේ පෞද්ගලික උපකාරක පංති බිහි වී ඇත. ඒ අනුව අ.පො.ස ( උසස් පෙළ) විභාග ප්‍රතිඵල සඳහා උපකාරක පංති මඟින් බලපෑමක් සිදු වන්නේද, යන්න අරමුණු කර ගෙන මෙම පර්යේෂණය සිදු කර ඇත. මෙම අධ්‍යයනය සඳහා නිකවැරටිය අධ්‍යාපන කොට්ඨාසයේ එක් පාසලක අ.පො.ස. උසස් පෙළ හැදෑරූ සිසුන්ගෙන් සියලුම විෂය ධාරා නියොජනය වන පරිදි සිසුන් 100 නියදියක් ස්තෘත සසම්භාවි නියදුම් ක්‍රමය යොදා ගනිමින් සමීක්ෂණයට භාජනය කරන ලදි. ප්‍රශ්නාවලියක් මෙන්ම සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. එම දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම මඟින් විශ්ලේෂණය කරන ලදි. මෙම අධ්‍යයනයට අනුව පාසල තුලින් ලබන දැනුම ප්‍රමාණවත් නොවන බව අනාවරණය කර ගත හැකි විය. ලබා ගන්නා ලද දත්ත වලට අනුව තරඟකාරිත්වය හේතුවෙන් විධිමත් දැනුම ගවේෂණයට දක්වන උදාසීන ගතිය මෙන්ම උපකාරක පංති පවත්තවන ගුරුවරුන්ගේ පංති වලට යොමු කර ගැනිමට සිදුකරන විවිධ ආකර්ෂණ වැඩ පිළිවෙළවල් නිසා ද පාසලෙන් ලබන දැනුමට අමතරව දැනුමක් ලබා ගැනිමට උපකාරක පංතිවලට සිසුන් යොමු විම හේතු කොට ගෙන උපකාරක පංති මඟින් සිසුන්ගේ උසස් පෙල ප්‍රතිඵල ඉහළ යන බව අනාවරණය විය. එබැවින් සිසුන් ඉතා සීඝ්‍රයෙන් උපකාරක පංති වලට යොමු වන බව තහවුරු විය.

**මුඛ්‍ය පද :** අ.පො.ස. උසස් පෙළ, පාසල් අධ්‍යාපනය, උපකාරක පංති

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, thilinipj3057@gmail.com